# 11. පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම - ගැලීම් සටහන

| | |
|---|---|
| (කොළ) | ඩිජිටල්කරණ දත්ත භාවිත කිරීම |
| (කහ) | ඉලෙක්ට්‍රොනික පණිවුඩ / ගනුදෙනු (SMS / WhatsApp / e-mail) |

සභාවේ වෙබ් අඩවියෙන් හෝ පෙරටු කාර්යාලයෙන් ඉල්ලුම් පත්‍රය ලබා ගෙන සම්පූර්ණ කර ඇමුණුම් සමග පෙරටු කාර්යාලයට භාර දීම

වගකීම: ඉල්ලුම්කරු

↓

අදාළ ඇමුණුම් සමග ඉල්ලුම් පත්‍රය භාර ගෙන පෙරසැරි ගාස්තුව අය කර ගැනීම සහ ලදුපත හා පසු විපරම් අංකයක් නිකුත් කිරීම

වගකීම: පෙරටු කාර්යාල නිලධාරි

↓

ඉල්ලුම් පත්‍රය සහ ඇමුණුම් ඇතුළත් ගොනුව පරිසර විෂය භාර නිලධාරි / පරිසර නිලධාරි වෙත යොමු කිරීම

වගකීම: පෙරටු කාර්යාල නිලධාරි

↓

ඉල්ලුම් පත්‍රය සහ ඇමුණුම් ඇතුළත් ගොනුව පරීක්ෂණ කමිටුවට යොමු කර පරීක්ෂණයට පැමිණෙන දිනය ඉල්ලුම්කරුට දැන්වීම

වගකීම: පරිසර විෂය භාර නිලධාරි / පරිසර නිලධාරි

↓

ක්ෂේත්‍ර පරීක්ෂණය කර ඉල්ලීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ වාර්තාව නාගරික කොමසාරිස්ට / ලේකම්ට ඉදිරිපත් කිරීම

වගකීම: පරීක්ෂණ කමිටුව

↓

බලපත්‍රය නිකුත් කිරීම නිර්දේශිත ද?

**ඔව්**

පරිසර ආරක්ෂණ බලපත්‍රය සකස් කර අත්සනට ඉදිරිපත් කිරීමට නියෝග කිරීම

වගකීම: නාගරික කොමසාරිස් / ලේකම්

↓

පරිසර ආරක්ෂණ බලපත්‍රය සකස් කර අත්සන සඳහා යොමු කිරීම

වගකීම: පරිසර විෂය භාර නිලධාරි / පරිසර නිලධාරි

↓

පරිසර ආරක්ෂණ බලපත්‍රය අත්සන් කර පරිසර විෂය භාර නිලධාරිට යොමු කිරීම

වගකීම: නගරාධිපති / සභාපති

↓

පරිසර ආරක්ෂණ බලපත්‍රය භාර දීම හෝ තැපැලෙන් යැවීම

වගකීම: පරිසර විෂය භාර නිලධාරි / පරිසර නිලධාරි

**නැත**

හේතු දක්වමින් ප්‍රතික්ෂේප කළ බව දැන්වීම

වගකීම: නාගරික කොමසාරිස් / ලේකම්

↓

අඩුපාඩු දක්වා තිබේ නම්, ඒවා නිවැරදි කර වාර්තා කිරීම (→ ඉල්ලුම් පත්‍රය සහ ඇමුණුම් ඇතුළත් ගොනුව පරිසර විෂය භාර නිලධාරි / පරිසර නිලධාරි වෙත යොමු කිරීම)

වගකීම: ඉල්ලුම්කරු

හෝ

ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අමාත්‍යාංශ ලේකම්ට අභියාචනය කිරීම

වගකීම: ඉල්ලුම්කරු

කාර්යසාධක දර්ශකය



# 11. පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම

**1. හැඳින්වීම**

ඇතැම් කර්මාන්ත හෝ ක්‍රියාකාරකම් හේතුවෙන් පරිසරයට සිදු විය හැකි අහිතකර බලපෑම් අවම කිරීම සඳහා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතෙන් පැවරී ඇති බලතල යටතේ එම කර්මාන්ත හෝ ක්‍රියාකාරකම් විධිමත් කිරීමට හා පාලනය කිරීමට පරිසර විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග අනුව, එවැනි යම් කර්මාන්තයක් හෝ ක්‍රියාකාරකමක් කිරීමට පෙර මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබා ගත යුතු බලපත්‍රයකි.

සටහන: i. ඉහත නියෝග අනුව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලය මධ්‍යම පරිසර අධිකාරිය වෙත පැවරී ඇත.

ii. මෙහි ඇමුණුම 01 හි දක්වා ඇති කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා ලබා ගත යුතු පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නිකුත් කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය වෙත පැවරී ඇති බලතල, එකී ජාතික පාරිසරික පනතේ 26 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් පළාත් පාලන ආයතනවලට පවරනු ලැබ ඇත.

iii. පළාත් පාලන ආයතනයක් විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර භාර ගනු ලබන්නේ එකී ඇමුණුමෙහි සඳහන් කර්මාන්ත සම්බන්ධයෙන් පමණක් වන අතර සෙසු කර්මාන්ත සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරියෙන් නිකුත් කරනු ලබන බලපත්‍රයක් ලබා ගත යුතු ය.

**2. නීතිමය අධිකාරය**

(අ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත;

(ආ) මෙහි ඇමුණුම 02 හි ඇතුළත් කර ඇති 2022. 01. 27 වන දිනය දක්වා ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති, එකී පනත යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝග.

**3. සුදුසුකම්**

(අ) පළාත් පාලන ආයතන බල ප්‍රදේශය ඇතුළත ඇමුණුම 01 හි සඳහන් කිසියම් කර්මාන්තයක් ආරම්භ කිරීමට අදහස් කරනු ලබන නැතහොත් එවැනි කර්මාන්තයක් කර ගෙන යනු ලබන තැනැත්තෙකු විය යුතු ය.

(ආ) අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගවලින් කර ඇති නියම සම්පූර්ණ කර තිබිය යුතු ය:

**4. ගාස්තුව**

(අ) ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු. 200.00

(ආ) ක්‍රියාවලිය සඳහා අය කරනු ලබන පරීක්ෂණ ගාස්තුව ව්‍යාපාරයේ ප්‍රාග්ධනය අනුව පහත පරිදි වේ.

| | ආයෝජනය (රු) | පරීක්ෂණ ගාස්තුව (රු) |
|---|---|---|
| 01 | 250,000 හෝ ඊට අඩු | 3,000.00 |
| 02 | 250,001 ට වැඩි එහෙත් 500,000 දක්වා | 3,750.00 |
| 03 | 500,001 ට වැඩි එහෙත් 1,000,000 දක්වා | 5,000.00 |
| 04 | 1,000,000 ට වැඩි | 10,000.00 |

(ඇ) පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව රුපියල් 3,000.00 කි.

## 5. ඉදිරිපත් කළ යුතු ලේඛන

(අ) පරිසර ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම් පත්‍රය. (පෙරටු කාර්යාලයෙන් හෝ මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකි ය)

(ආ) කර්මාන්තය හෝ ව්‍යාපාරය පිහිටා ඇති ස්ථානයට යන මාර්ගයේ දළ සටහනක්.

(ඇ) ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කළ පිටපතක්.

(ඈ) අදාළ ස්ථානයේ අනුමත ගොඩනැගිලි සැලැස්ම සහ අනුකූලතා සහතිකය.

(ඉ) ඉඩමේ අනුමත කළ මිනින්දෝරු සැලැස්මේ සහතික කළ පිටපතක්.

(ඊ) කාර්යයේ යොදවන සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර

සටහන: කර්මාන්තය පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල ඒ කාර්යය සඳහා ම ගොඩනඟන ලද එකක් විය යුතු අතර, ඉහත සඳහන් අනුමත ගොඩනැගිලි සැලැස්ම සහ අනුකූලතා සහතිකය ඒ අනුව ම විය යුතු ය.

## 6. ඉල්ලුම් කිරීමේ පටිපාටිය

| පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|
| සභාවේ වෙබ් අඩවියෙන් හෝ පෙරටු කාර්යාලයෙන් ඉල්ලුම් පත්‍රය ලබා ගෙන නිවැරදිව සම්පූර්ණ කර, අවශ්‍ය ඇමුණුම් සමග පෙරටු කාර්යාලයට භාර දීම | කර්මාන්තය ආරම්භ කිරීමට පෙර හෝ කලින් ලබා ගත් බලපත්‍රයේ වලංගු කාලය ඉකුත් වීමට පෙර | අයදුම්කරු |
| අදාළ ඇමුණුම් සමග ඉල්ලුම් පත්‍රය භාර ගෙන පෙරසැරි ගාස්තුව අය කර ගැනීම සහ ලදුපත සහ පසු විපරම් අංකයක් ඉල්ලුම්කරුට නිකුත් කිරීම | ඉල්ලුම් පත්‍රය භාර ගත් වහාම | පෙරටු කාර්යාල නිලධාරි |
| ඉල්ලුම් පත්‍රය සහ ඇමුණුම් සහිත ගොනුව පරිසර විෂය භාර නිලධාරි / පරිසර නිලධාරි වෙත යොමු කිරීම | ඉල්ලුම් පත්‍රය භාර ගත් වහාම | පෙරටු කාර්යාල නිලධාරි |
| ඉල්ලුම් පත්‍රය සහ ඇමුණුම් ඇතුළත් ගොනුව පරීක්ෂණ කමිටුවට යොමු කර ක්ෂේත්‍ර පරීක්ෂණයට පැමිණෙන දිනය ඉල්ලුම්කරුට දැන්වීම | ඉල්ලුම් පත්‍රය තමන් වෙත ලැබුණු වහාම | පරිසර විෂය භාර නිලධාරි / පරිසර නිලධාරි |
| ක්ෂේත්‍ර පරීක්ෂාව කර ඉල්ලීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ වාර්තාව නාගරික කොමසාරිස්ට / ලේකම්ට ඉදිරිපත් කිරීම | ඉල්ලුම් පත්‍රය තමන් වෙත ලැබූ දින සිට දින 7 ක් ගත වීමට පෙර | පරීක්ෂණ කමිටුව |
| පරිසර ආරක්ෂණ බලපත්‍රය සකස් කිරීමට නියෝග නිකුත් කිරීම | නිර්දේශිත වාර්තාව ලැබුණු දින සිට දින 2 ක් ඇතුළත | නාගරික කොමසාරිස් / ලේකම් |
| පරිසර ආරක්ෂණ බලපත්‍රය සකස් කර අත්සන සඳහා ඉදිරිපත් කිරීම | නියෝගය ලැබුණු වහාම | පරිසර විෂය භාර නිලධාරි / පරිසර නිලධාරි |
| පරිසර ආරක්ෂණ බලපත්‍රය අත්සන් කිරීම | සකස් කළ බලපත්‍රය තමන් වෙත ලැබුණු දින ම | නගරාධිපති / සභාපති |
| ඉල්ලුම්කරුට පරිසර ආරක්ෂණ බලපත්‍රය භාර දීම හෝ තැපැලෙන් යොමු කිරීම | අත්සන් කළ බලපත්‍රය ලැබුණු දින හෝ ඊට පසු දින | පරිසර විෂය භාර නිලධාරි / පරිසර නිලධාරි |

සටහන: 1. ඉල්ලුම් පත්‍රය භාර ගන්නා අවස්ථාවේ දී එහි නිරවද්‍යතාව පරීක්ෂා කර බැලිය යුතු අතර අඩු පාඩු කිසිවක් වේ නම්, ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙමින් ඉල්ලුම් පත්‍රය භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කළ යුතු ය.

2. පරීක්ෂණ කමිටුවේ සංයුතිය: ඉංජිනේරු / ලේකම්, මහජන සෞඛ්‍ය පරීක්ෂක, තාක්ෂණ නිලධාරි සහ පරිසර නිලධාරි

3. බලපත්‍රය අලුත් කිරීමක දී අනුමත ගොඩනැගිලි සැලැස්ම සහ අනුකූලතා සහතිකය අවශ්‍ය නොවේ.

**7. පරිසර තාක්ෂණික කමිටුව විසින් ඉල්ලීම නිර්දේශ කර නොමැති විට,**

| පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|
| ඉල්ලීම නිර්දේශ කර නැති විට, ඊට හේතු සහ නැවත සලකා බැලීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා දැනුම් දීම | නිර්දේශිත වාර්තාව ලැබුණු දින සිට දින දෙකක් ඇතුළත | නාගරික කොමසාරිස් / ලේකම් |
| අවශ්‍යතා සම්පූර්ණ කළ බව වාර්තා කිරීම | | ඉල්ලුම්කරු |
| 6 ඡේදයේ ඉදිරි කාර්ය පියවර අනුගමනය කිරීම | | |

**8. බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කර ඇති විට, අභියාචනය කිරීමේ පටිපාටිය:**

| පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|
| ඉල්ලුම්කරු විසින් පරිසර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනය කිරීම | ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම ලැබී දින 30 ක් ගත වීමට පෙර | ඉල්ලුම්කරු |
| අභියාචන පරීක්ෂණය කිරීම | අභියාචනය ලැබී දින 07 ක් ඇතුළත | පරිසර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් |
| අභියාචනය සම්බන්ධ තීරණය නිකුත් කිරීම | | පරිසර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් |

සටහන: 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23ඉ වගන්තිය යටතේ මේ අභියාචනය සඳහා අවස්ථාව ලැබී ඇත. අභියාචනය සම්බන්ධයෙන් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසානාත්මක වේ.

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වන වගන්තියෙන් ලැබී ඇති බලය යටතේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලතල පවරනු ලැබ ඇති කර්මාන්ත ලැයිස්තුව.

1. සියලු ම වාහන ඉන්ධන පිරවුම් හල් (ද්‍රව පෙට්‍රෝලියම් හා ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු)
2. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යොදවන ඉටි පන්දම් නිෂ්පාදන කර්මාන්ත.
3. 10 ක් හෝ ඊට වැඩි එහෙත් 25 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන පොල් තෙල් සිඳීමේ කර්මාන්ත.
4. 10 ක් හෝ ඊට වැඩි එහෙත් 25 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන මද්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
5. වියලි ක්‍රියාවලි සහිත වී මෝල්.
6. මාසික නිෂ්පාදන ධාරිතාව කිලෝ ග්‍රෑම් 1,000 කට අඩු වන ඇඹරුම් හල්.
7. දුම් කොළ වේලීමේ කර්මාන්ත
8. සල්ෆර් දුම් ගැසීම සහිත එක් ක්‍රියාවලියක දී නිෂ්පාදන ධාරිතාව කිලෝ ග්‍රෑම් 500 හෝ ඊට වැඩි ධාරිතාවක් සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
9. කෑමට ගන්නා ලුණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත.
10. ක්ෂණික තේ කර්මාන්ත ශාලා හැර අනෙකුත් තේ කර්මාන්ත ශාලා
11. කොන්ක්‍රීට් පෙර සවි කර්මාන්ත
12. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
13. දිනකට මෙට්‍රික් ටොන් 20 ට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත හුණු පෝරණු
14. ප්ලාස්ටර් ඔෆ් පැරිස් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ සේවකයන් 25 ට අඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්ත පිඟන් මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
15. සියලු බෙලි කටු ඇඹරීමේ කර්මාන්ත
16. උළු සහ ගඩොල් කර්මාන්ත
17. එක් වරකට එක් බෝර වලක් බැගින් පුපුරවමින් මසකට ඝන මීටර 600 ක නිෂ්පාදන ධාරිතාවකට අඩු මිනිස් ශ්‍රමය හා පුපුරන ද්‍රව්‍ය භාවිතයෙන් සිදු කරනු ලබන කැණීම්.
18. දිනකට ඝන මීටර් 50 ට අඩු දැව ඉරුම් ධාරිතාවක් ඇති ලී මෝල් හෝ බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්ත හෝ දැව පදම් කිරීමේ කර්මාන්ත
19. බහු කාර්ය යන්ත්‍ර භාවිත කරන වඩු කර්මාන්ත හෝ සේවකයන් 5 ට වැඩි එහෙත් 25 ට අඩු ගණනක් සේවයේ යෙදෙන දැව ආශ්‍රිත කර්මාන්ත
20. නේවාසික කාමර 5 කට වැඩි සහ 20 ට අඩු හෝටල්, ආගන්තුක නිවාස සහ තානායම්
21. වාහනවල වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ, නඩත්තු කිරීමේ හා සවි කිරීමේ කටයුතු හෝ විසිරි පින්තාරු කටයුතු සිදු කරන ගරාජ හැර අනෙකුත් වාහන අලුත්වැඩියා කිරීමේ, නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ
22. ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සවි කිරීම සිදු කරන ස්ථාන
23. වාහන සේවා කටයුතු සේවා සිදු නො කරන කන්ටේනර් බහාලුම් පර්යන්ත
24. සේවකයන් 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියලු ම විදුලි හෝ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ අලුත්වැඩියා කිරීමේ ස්ථාන
25. ඊයම් උණු කිරීම සිදු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර

08. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ සාදන ලද නියෝග ඇතුළත් ගැසට් නිවේදනවල යොමුව

| # | ගැසට් අංකය | දිනය | පනතේ වගන්තිය | විස්තරය |
|---|---|---|---|---|
| 01 | 772 / 22 | 1993. 06. 24 | 23ප | ව්‍යාපෘති අනුමත කිරීමේ අනු යෝජිත ආයතන<br>සංශෝධන: - 1995. 11. 05 දිනැති අංක 1104 / 22 |
| 02 | 850 / 4 | 1994. 12. 20 | 23ද | ජාතික පාරිසරික (සංසරණ වායු තත්ත්ව) නියෝග<br>සංශෝධන: - 2008. 08. 15 දිනැති අංක 1562 / 22<br>- 2003. 10. 10 දිනැති අංක 1309 / 20 |
| 03 | 850 / 4 | 1994. 12. 20 | 32 | ජාතික පාරිසරික (සංසරණ වායු තත්ත්ව) නියෝග |
| 04 | 850 / 4 | 1994. 12. 20 | 23ඉ | 1994 ජාතික පාරිසරික (අභියාචන පටිපාටිය) නියෝග |
| 05 | 859 / 14 | 1995. 02. 23 | 23ප | ව්‍යාපෘති අනුමත කිරීමේ නියෝජිතායතන ලැයිස්තුව |
| 06 | 1104 / 22 | 1995. 11. 05 | 23බ | ව්‍යාපෘති අනුමත කිරීමේ නියෝජිතායතන<br>සංශෝධන: - 1993. 06. 24 දිනැති අංක 772 / 22 පූර්ව ගැසට් නිවේදනය<br>- 1999. 11. 29 දිනැති අංක 1108 / 12 |
| 07 | 924 / 12 | 1996. 05. 23 | 23ච, 23ජ හා 23ට | 1996 අංක 1 දරන ජාතික පාරිසරික (ශබ්ද පාලන) නියෝග<br>සංශෝධන: - 1997. 04. 30 දිනැති අංක 973 / 7 |
| 08 | 973 / 7 | 1997. 04. 30 | 23ච හා 23ජ | 1997 අංක 1 දරන ජාතික පාරිසරික (ශබ්ද පාලන) නියෝග<br>සංශෝධන: - 1996. 05. 23 දිනැති අංක 924 / 12 |
| 09 | 1108 / 12 | 1999. 11. 29 | | 1995. 11. 05 දිනැති අංක 1104 / 22 ගැසට් නිවේදනය නිවැරදි කිරීමකි |
| 10 | 1159 / 22 | 2000. 11. 22 | 23අ | බලපත්‍රයක් ලබා ගැනීමට නියමිත ක්‍රියාකාරකම්<br>සංශෝධන: - 2008. 01. 25 දිනැති අංක 1533 / 16 ගැසට් පත්‍රයෙන් මෙම නිවේදනය පරිච්ඡින්න කර ඇත |
| 11 | 1283 / 19 | 2003. 04. 10 | 10 (අ) (ඉ) හා ( උ) සහ 32 (2) (ඩ) | 2003 අංක 1 දරන ජාතික පාරිසරික (ඉහළ කොත්මලේ විදුලි බල ව්‍යාපෘතිය - අධීක්ෂණ) නියෝග |
| 12 | 1295 / 11 | 2003. 06. 30 | 23ඒ හා 23ඔ | 2003 අංක 1 දරන ජාතික පරිසර (වායු විමෝචන, ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති) නියෝග<br>සංශෝධන: - 2008. 08. 15 දිනැති අංක 1562 / 22 |
| 13 | 1309 / 20 | 2003. 10. 10 | 23ද | ජාතික පාරිසරික (සංසරණ වායු තත්ත්ව) නියෝග |
| 14 | 1373 / 6 | 2004. 12. 29 | 23ප | ව්‍යාපෘති අනුමත කිරීමේ නියෝජිතායතන ලැයිස්තුවට සංශෝධන |
| 15 | 1466 / 5 | 2006. 10. 10 | 23ද | මයික්‍රොන් 20 ට අඩු පොලිතින් තහනම් කිරීම<br>සංශෝධන: - 2017. 09. 01 දිනැති අංක 2034 / 33 ගැසට් පත්‍රයෙන් මෙම නිවේදනය පරිච්ඡින්න කර ඇත |

| # | ගැසට් අංකය | දිනය | පනතේ වගන්තිය | විස්තරය |
|---|---|---|---|---|
| 16 | 1466 / 26 | 2006. 10. 13 | 24ඇ හා 24ඈ | මුතුරාජවෙල පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම<br>සංශෝධන: - 2018. 09. 25 දිනැති අංක 2090 / 11 |
| 17 | 1487 / 10 | 2007. 03. 05 | 24ඇ හා 24ඈ | තලංගම පාරිසරික ආරක්ෂක ප්‍රදේශය සහ ග්‍රෙගරි වැව ආරක්ෂිත ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම<br>සංශෝධන: - 2021. 07. 19 දිනැති අංක 2237 / 7 ගැසට් නිවේදනයෙන් තලංගම ආරක්ෂක ප්‍රදේශයට අදාළ නියමය සංශෝධනය කර ඇත<br>- 2021. 10. 01 දිනැති අංක 2247 / 32 ගැසට් නිවේදනයෙන් ග්‍රෙගරි වැව ආරක්ෂක ප්‍රදේශයට අදාළ නියමය සංශෝධනය කර ඇත |
| 18 | 1507 / 9 | 2007. 07. 23 | 24ඇ හා 24ඈ | නකල්ස් පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම |
| 19 | 1533 / 16 | 2008. 01. 25 | 23අ | බලපත්‍රයක් ලබා ගැනීමට නියමිත ක්‍රියාකාරකම් |
| 20 | 1534 / 18 | 2008. 02. 01 | 23අ හා 23ආ | 2008 අංක 1 දරන ජාතික පාරිසරික (ආරක්ෂණ සහ තත්ත්ව) නියෝග |
| 21 | 1557 / 14 | 2008. 07. 09 | 23ඒ හා 23ඔ | 2003 අංක 1 දරන ජාතික පරිසර (වායු විමෝචන, ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති) නියෝගවලට සංශෝධන<br>සංශෝධන: - 2003. 06. 30 දිනැති අංක 1295 / 11 දරන ගැසට් පත්‍රයට සංශෝධන |
| 22 | 1560 / 26 | 2008. 08. 01 | 24ඇ හා 24ඈ | මාරගල කඳුවැටිය පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම |
| 23 | 1562 / 22 | 2008. 08. 15 | 32 | ජාතික පාරිසරික (සංසරණ වායු තත්ත්ව) නියෝග<br>සංශෝධන: - 1994. 12. 20 දිනැති අංක 850 / 4 දරන ගැසට් පත්‍රයට සංශෝධන |
| 24 | 1598 / 21 | 2009. 04. 24 | 24ඇ හා 24ඈ | වලව්වේ වත්ත වතුරාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම |
| 25 | 1627 / 19 | 2009. 11. 10 | 32 (2) (ඌ) | 2009 අංක 1 දරන ජාතික පාරිසරික (නාගරික ඝන අපද්‍රව්‍ය) නියෝග |
| 26 | 1634 / 23 | 2009. 12. 30 | 24ඇ හා 24ඈ | බොල්ගොඩ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම |
| 27 | 1641 / 28 | 2010. 02. 17 | 24ඇ හා 24ඈ | හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම |
| 28 | 1738 / 37 | 2011. 12. 29 | 23ජ | 2011 අංක 1 දරන ජාතික පාරිසරික (වාහන නලා) නියෝග |
| 29 | 1887 / 20 | 2014. 11. 05 | 23ඒ හා 23ඔ | 2003 අංක 1 දරන ජාතික පරිසර (වායු විමෝචන, ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති) නියෝග<br>සංශෝධන: - 2003. 06. 30 හා අංක 1295 / 11<br>2008. 07. 09 හා අංක 1557 / 14 |

| # | ගැසට් අංකය | දිනය | පනතේ වගන්තිය | විස්තරය |
|---|---|---|---|---|
| 30 | 1895 / 43 | 2015. 01. 02 | 23ඒ හා 23ඔ | 2003 අංක 1 දරන ජාතික පරිසර (වායු විමෝචන, ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති) නියෝගවලට නිවැරදි කිරීමේ නිවේදනය |
| 31 | 2024 / 6 | 2017. 06. 19 | 24ඇ හා 24ඈ | වරාතැන්න හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම |
| 32 | 2034 / 33 | 2017. 09. 01 | 23ද | මයික්‍රොන් 20 ට අඩු පොලිතින් තහනම් කිරීම<br>සංශෝධන: - 2006. 10. 10 දින අංක 1466 / 5 ගැසට් නිවේදනයේ නියෝග මෙම නියෝගවලින් පරිච්ඡින්න කර ඇත |
| 33 | 2034 / 34 | 2017. 09. 01 | 23ද | දේශීය භාවිතය සඳහා පොලිතින් අමුද්‍රව්‍යයක් වන ආහාර දවටන නිපදවීම තහනම් කිරීම |
| 34 | 2034 / 35 | 2017. 09. 01 | 23ද | වැඩි ඝනත්වයෙන් යුතු පොලිඑතිලින් අමුද්‍රව්‍යයක් වන මලු නිපදවීම තහනම් කිරීම |
| 35 | 2034 / 36 | 2017. 09. 01 | 23එ හා 23ඒ | 2017 අංක 1 දරන ජාතික පාරිසරික (ප්ලාස්ටික් අඩංගු කසළ සහ පහසුවෙන් දැවෙන වෙනත් ද්‍රව්‍ය එළිමහනේ පිළිස්සීම තහනම් කිරීම) නියෝග |
| 36 | 2034 / 37 | 2017. 09. 01 | 23ද | සියලු ම ආකාරයේ පොලිඑතිලින්, පොලිප්‍රොපිලින්, පොලිඑතිලින් නිෂ්පාදන හෝ පොලිප්‍රොපිලින් නිෂ්පාදන, දේශපාලන, සමාජයීය, ආගමික, ජාතික, සංස්කෘතික හෝ වෙනත් උත්සව හෝ අවස්ථාවල දී සැරසිලි සඳහා තහනම් කිරීම. |
| 37 | 2034 / 38 | 2017. 09. 01 | 23ද | දේශීය භාවිතය සඳහා ප්‍රසාරිත පොලියස්ටරින්වලින් ආහාර ඇසුරුම් පෙට්ටි, පිඟන්, කෝප්ප හා හැඳි නිෂ්පාදනය තහනම් කිරීම |
| 38 | 2075 / 15 | 2018. 06. 11 | 24ඇ හා 24ඈ | පන්සලාතැන්න-මාඋස්සාව පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම |
| 39 | 2079 / 42 | 2018. 07. 12 | 23ඒ හා 23ඔ | 2003 අංක 1 දරන ජාතික පරිසර (වායු විමෝචන, ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති) නියෝග<br>සංශෝධන: - 2003. 06. 30 දිනැති අංක 1295 / 11 |
| 40 | 2083 / 3 | 2018. 08. 06 | 23ඒ හා 23ඔ | 2003 අංක 1 දරන ජාතික පරිසර (වායු විමෝචන, ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති) නියෝග<br>සංශෝධන: - 2003. 06. 30 දිනැති අංක 1295 / 11 |
| 41 | 2090 / 11 | 2018. 09. 25 | 24ඇ හා 24ඈ | මුතුරාජවෙල පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීමේ නියෝග<br>සංශෝධන: - 2006. 10. 13 දිනැති අංක 1466 / 26 |
| 42 | 2126 / 36 | 2019. 06. 05 | 23එ, 23ඒ හා 23ඔ | 2019 අංක 1 දරන ජාතික පාරිසරික (ස්ථානීය ප්‍රභව විමෝචන පාලන) නියෝග |
| 43 | 2148 / 19 | 2019. 11. 05 | 32 (2) (ච) | 2019 අංක 1 දරන දැන්වීම් පුවරු සහ ප්‍රචාරක පුවරු පාලනය කිරීමේ (දෘෂ්ටි දූෂණය) නියෝග |

| # | ගැසට් අංකය | දිනය | පනතේ වගන්තිය | විස්තරය |
|---|---|---|---|---|
| 44 | 2148 / 20 | 2019. 11. 05 | 23උ හා 32 | 2019 අංක 1 දරන ජාතික පාරිසරික (සංසරණ ජල තත්ත්ව) නියෝග |
| 45 | 2211 / 50 | 2021. 01. 21 | 32 | 2019 අංක 1 දරන ජාතික පාරිසරික (ප්ලාස්ටික් ද්‍රව්‍ය හඳුනා ගැනීමේ ප්‍රමිති) නියෝග |
| 46 | 2211 / 51 | 2021. 01. 21 | 23ද (1) (අ) | කෘෂි රසායන ද්‍රව්‍ය ඇසුරුම් කිරීමට පොලිඑතිලින් ටෙරප්තැලේට් හෝ පොලිවයිනයිල් ක්ලොරයිඩ් ද්‍රව්‍ය ඇතැම් ප්ලාස්ටික් ද්‍රව්‍ය භාවිතය තහනම් කිරීම |
| 47 | 2237 / 7 | 2021. 07. 19 | 24ඇ හා 24ඇ | තලංගම පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ප්‍රකාශයට පත් කළ නියමය<br>සංශෝධන: - 2007. 05. 05 දිනැති අංක 1487 / 10 |
| 48 | 2247 / 32 | 2021. 10. 01 | 24ඇ හා 24ඇ | තලංගම පාරිසරික ආරක්ෂක ප්‍රදේශය සහ ශ්‍රෙගරි වැව ආරක්ෂිත ප්‍රදේශය<br>සංශෝධන: - 2007. 03. 05 දිනැති අංක 1487 / 10 දරන ගැසට් නිවේදනයෙන් ග්‍රෙගරි වැව ආරක්ෂක ප්‍රදේශයට අදාළ නියමය සංශෝධනය කිරීමකි |
| 49 | 2264 / 17 | 2022. 01. 27 | 23අ සහ 23ආ | 2008 අංක 1 දරන ජාතික පාරිසරික (ආරක්ෂණ සහ තත්ත්ව) නියෝගවලට සංශෝධන |
| 50 | 2264 / 18 | 2022. 01. 27 | 23අ | අපද්‍රව්‍ය කටයුතු සම්බන්ධ බලපත්‍ර ලබා ගත යුතු ක්‍රියාකාරකම් |